**බලංගොඩ ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 16 හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් ඉඩම් 13 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරු කර ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ආ) | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 නොවැම්බර් මස සභාව වෙත ලබාදී තිබුණු රු. 645,381 ක් වටිනා ගැල්වනයිස් බට 583 ක් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වේ. | 2019 ගිණුම් පිළියෙල කිරීමේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | පළාත් සභාවේ ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු රු. 5,440,572 ක් ගිණුම්ගතකර නොතිබුණි. | ලැබීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | ඉකුත් වර්ෂයට අදාල පුනරාවර්තන ආදායම් රු. 23,000 ක් සහ ප්‍රාග්ධන ආදායම් රු. 807,477 ක් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | කාලපරිච්ඡේද නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | අතපසුවීමකි. ඉදිරියේදී මෙම අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ඉදිකිරීමට අදාලව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු. 5,440,572 ක් ගිණුම්ගතකර නොතිබුණි. | උපචිත වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | 2012 සිට 2016 දක්වා වූ වර්ෂවලට අදාලව එකතුව රු. 963,083 ක් වූ කර්මාන්ත ණය හිමි ශේෂ 15 ක් නිරවුල් කිරීමට 2019 මාර්තු වනවිටත් කටයුතු කර නොතිබුණි. | කාලීනව ගිණුම් නිරවුල් කළ යුතු වේ. | ඉදිරියේදී මෙම කර්මාන්ත ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (උ) | 2009, 2012, 2015 සහ 2016 වර්ෂවලට අදාලව එකතුව රු. 76,375 ක් වූ වියදම් ණයහිමි ශේෂ 05 ක් නිරවුල් කිරීමට 2019 මාර්තු වනවිටත් කටයුතු කර නොතිබුණි. | කාලීනව ගිණුම් නිරවුල් කළ යුතු වේ. | ඉදිරියේදී මෙම වියදම් ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

-------------------

නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

| | නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | වටිනාකම රු. | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | | |
| | (i) 24 වන වගන්තියේ 1 (අ) හා (ආ) උප වගන්ති | 1974 වර්ෂයෙන් පසු සභාව සතු මාර්ග සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | - | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ප්‍රාදේශීය සභාව සතු මාර්ග සම්බන්ධයෙන් පනතේ වගන්ති අනුව කටයුතු කරමි. |
| | (ii) 154(1) වගන්තිය | ඉඩම් කට්ටිකර විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට එකක බද්දක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු නමුත් ඉඩම් කට්ටි 6 කින් බදු අය කර ගෙන නොතිබුණි. | - | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | කට්ටි කර විකුණා ඇති ඉඩම් සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පනතේ වගන්තිය පරිදි අවශ්‍ය කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) මුදල් රෙගුලාසි 371 (5) | 1992 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා නිකුත් කර තිබුණු අතුරු අග්‍රිම 37 ක් 2019 පෙබරවාරි වනවිටත් පියවා නොතිබුණි. | 557,848 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී තොරතුරු සොයා බලා පියවා ගැනීමට කටයුතු කරමි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | හිමිකම් නොපාන ලද ඉකුත් තැන්පතු 266 ක් නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 1,610,698 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී සෑම අර්ධ වර්ෂයක් අවසානයේම හිමිකම් නොපාන ලද ඉකුත් තැන්පතු නියාදනය කිරීමට කටයුතු කරමි. |
| (ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2018 හා 2018 මාර්තු 19 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ගර්හිත තත්ත්වයේ පවතින කැබ් රථයක්, රෝද 4 ට්‍රැක්ටර් 02 ක්, රෝද 02 ට්‍රැක්ටර් 03 ක්, ට්‍රැක්ටර් ට්‍රේලර් 04 ක් සහ ට්‍රැක්ටර් කොටස් 22 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | - | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | මෙම කැබ් රථය හා යන්ත්‍ර උපකරණවල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගෙන නොමැති අතර මහා සභාවේ තීරණය පරිදි ඒවායේ අයිතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කර ඇති අතර දිරාපත් වෙමින් පවතින මෙම රථය හා උපකරණ ඉදිරියේදී වෙන්දේසි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගගෝපදේශ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව අවස්ථා 04 කදී එක් ආයතනයකින් පමණක් | 467,833 | මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ | මෙම උපකරණ මිලදීගත් ආයතනය භාණ්ඩ නිෂ්පාදිත |

| | | | |
|---|---|---|---|
| සංග්‍රහයේ 3.4 වගන්තිය | මිල ගණන් කැඳවා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. | යුතු වේ. | ආයතනයක් බැවින් වෙනත් ආයතන වලින් මිල ගණන් කැඳවීම සිදු නොකළ අතර ඉදිරියේදී මිලදී ගැනීම් වලදී ආයතන කිහිපයකින් මිල ගණන් කැඳවා මිලදී ගැනීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,220,843 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,830,848 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළුහිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,723,425 | 1,723,425 | 1,306,730 | 269,540 | 1,523,380 | 1,523,380 | 2,324,990 | 253,318 |
| (ii) | කුලී | 3,389,750 | 3,396,000 | 2,679,638 | 74,343 | 3,553,375 | 3,553,375 | 2,188,057 | 158,343 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 507,500 | 507,500 | 620,916 | 141,100 | 232,500 | 232,500 | 312,310 | 96,100 |
| (iv) | වරෙන්තු ගාස්තු හා දඩ | 2,052,500 | 2,787,045 | 2,460,690 | 2,937,182 | 2,602,500 | 2,663,582 | 1,349,935 | 2,651,591 |
| (v) | වෙනත් ආදායම් | 7,767,500 | 7,767,500 | 676,584 | 19,812,938 | 5,908,500 | 5,388,500 | 9,523,338 | 12,506,264 |

2.2.2 වරිපනම් හා බදු

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1988/22 හා 1988 මැයි 17 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කර නොතිබූ අතර අවසන්වරට දේපල තක්සේරුව 2005 වර්ෂයේදී සිදුකර තිබීමෙන් නව දේපල තක්සේරුවක් මඟින් වරිපනම් බදු සංශෝධනය කර වරිපනම් ආදායම වැඩි කර ගැනීමට නොහැකි වී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වරිපනම් බදු නව තක්සේරුවක් සිදු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත කිහිප වරක් ලිපි මඟින් ඉල්ලීම් කළ අතර, ඒ අනුව 2019 තක්සේරු ප්‍රතිශෝධන වැඩසටහන සඳහා අප ප්‍රාදේශීය සභාව ඇතුළත් කර ඇති බවත් මෙම වසර තුලදී එම කටයුතු ආරම්භ කරන බවත් දිස්ත්‍රික් තක්සේරුකරු දැනුම් දී ඇත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,937,182 ක් හා 2017 සහ 2018 වර්ෂයන්ට අදාළව ලැබියයුතු මුද්දර ගාස්තු හඳුනා ගෙන අයකර ගැනීමට 2018 පෙබරවාරි වනවිටත් කටයුතු කර නොතිබුණි. | ආදායම් රැස්කර ගැනීමට ක්‍රියා කළ යුතු වේ. | 2018 වර්ෂය සඳහා වන උසාවි දඩ මුදල් ගෙන්වා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත උප ලේඛන ඉදිරිපත් කර ඇත. 2017 වර්ෂයට අදාල මුද්දර ගාස්තු ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය මඟින් පළාත් ආදායම් කොමසාරිස් වෙත ලබා දී ඇති අතර එම මුදල ඉදිරියේදී අප සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1. කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, මහජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු ප්‍රධාන කාරණා 30 න් කාරණා 28 ක් සඳහා 2018 නොවැම්බර් වනවිටත් අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අදාල අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීමට අවශ කටයුතු කරමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 ඉදිකිරීම් ආරම්භ කරන ලද මහජන විරෝධතාව හේතුවෙන් අතහැර දමා තිබුණු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සුදුසු ස්ථානයක් හඳුනාගෙන නැවත ආරම්භ කිරීමට සාමාලෝචිත වර්ෂය අවසාන වනවිට ද කටයුතු කර නොතිබුණි. එම නිසා සභා බල ප්‍රදේශය තුල කසළ එක්රැස් කිරීමක් සිදු නොකරන අතර එය මහජන සෞඛ්‍ය හා පාරිසරික ගැටළු ඇතිවීමට හේතු විය හැක. | කසළ කළමණාකරණය පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සභා බල ප්‍රදේශයේ කසළ එකතු කිරීම සඳහා කාල සටහනක් සකස් කර කලාප වශයෙන් මාර්ග අනුව බෙදා වෙන් කර ඇත. නමුත් එකතු කරන කසළ දැමීම සඳහා සුදුසු අපහරණ භූමියක් හෝ කසළ අංගනයක් සභාව සතුව නොමැති බැවින් කසළ එක්රැස් කිරීම සිදු කරනු නොලබන අතර ඒ සඳහා ඉඩමක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, සිය විෂයය පථයට අනුව ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ දිගු කාලීන සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ දිගුකාලීන සැලසුම් සකස් කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු වටිනාකම රු. 7,700,000 ක් වූ ව්‍යාපෘති 08 ක් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉටු කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අපොහොසත් වී තිබුණි. | ප්‍රමුඛතා පදනමක් මත මූලධන ව්‍යාපෘති සඳහා අයවැය පිළියෙල කිරීමට සහ ප්‍රතිපාදන ලැබෙන බව තහවුරු කර ගැනීමට ක්‍රියා කළ යුතු වේ. | 2018 අයවැය ලේඛනයේ මහජනතාවගේ ඉල්ලීම් මත සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කලද අදාළ වර්ෂය තුළ මධ්‍යම රජයෙන් හා පළාත් සභාවෙන් ප්‍රතිපාදන නොලැබුණු නිසා අපේක්ෂිත ආකාරයට සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමට නොහැකි වූ බව කාරුණිකව සඳහන් කර සිටිමි. |
| (ආ) | එක් එක් ගණුදෙනුවලට අදාළ රාජකාරී බෙදා නියම කල යුතු වුවත් මුදල් පොත, තැන්පත්, ණයහිමි හා අත්තිකාරම් ලේඛන පවත්වාගෙන යාම, චෙක්පත් ලිවීම, ගිණුම් වාර්තා පිළියෙල කිරීම සහ අවසාන ගිණුම් සකස් කිරීම එක් නිලධාරිණියකට පවරා තිබීම හේතුවෙන් මූල්‍ය අක්‍රමිකතා සිදු වීමේ අවධානමක් පැවතුණි. | එක් අයෙකුගේ කාර්යයන් තවත් අයෙකුගේ අධීක්ෂණයට ලක්වන ආකාරයට වැඩ බෙදීමක් කළ යුතු වේ. | ඉදිරියේදී රාජකාරී පවරන විට නිලධාරීන් කිහිප දෙනෙකු අතර මෙම රාජකාරී බෙදා දී ඉටුකරවා ගැනීමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුරප්පාඩුව පවතින ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා 2017 වර්ෂයේ සිට රාජ්‍ය කළමනාකරණ I ශ්‍රේණියේ නිලධාරිණියක් පත් කර තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ ලිපිය අනුව වැඩ බැලීමේ ලේකම් පත් කර ඇත. මෙම තනතුර පුරප්පාඩුව පවතින බව කොමසාරිස් කාර්යාලය වෙත අවස්ථා කිහිපයකදී ද දැනුම් දී ඇත. |
| (ආ) | වැඩ ක්ෂේත්‍ර පරිපාලක, ආයුර්වේද ඖෂධ සංයෝජක, ආදාහනාගාර ක්‍රියාකරු, පුස්තකාලයාධිපති, බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු, සෞඛ්‍ය කම්කරු, වැඩ ක්ෂේත්‍ර කම්කරු හා රියදුරු යන තනතුරුවල පවතින පුරප්පාඩු 15 ක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | මෙම තනතුරු පුරප්පාඩුව පවතින බව වාර්ෂික කාර්ය මණ්ඩල වාර්තා මඟින් ප්‍රධාන ලේකම් වෙත හා පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දී ඇත. ප්‍රාදේශීය සභාව මඟින් බඳවා ගත හැකි ප්‍රාථමික තනතුරු සඳහා ඉදිරියේදී සේවකයන් බඳවා ගැනීමට කටයුතු |

| | | |
|---|---|---|
| අදාල කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | | කරමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විකුණනු ලබන ඉඩම් වටිනාකමට අදාළ සියයට 1 ක බදු මුදල ඉඩම් විකිණීමත් සමඟ විකුණුම්කරු විසින් සභාවට ගෙවන බවට කොන්දේසි ඇතුලත් ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. 2006 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ඉඩම් වෙන්දේසි 22 කින් පොදු කටයුතු සඳහා සභාවට වෙන් කරන ලද පර්චස් 70.37 ක් වූ ඉඩම්වලට අදාල ඔප්පු ලබා ගෙන අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම වෙන්දේසි ඉඩම්වල වටිනාකම් හා ඔප්පු අංකවල නිරවද්‍යතාවය ද තහවුරු කර ගෙන නොතිබුණි. | විකුණුම්කරු සමඟ ගිවිසුම් ගත විය යුතු අතර අදාල පරිදි ඉඩම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | 1% ක බදු මුදල ඇතුළත් කොන්දේසි සහිත ගිවිසුමකට එළඹීමටත්, පර්චස් 70.37 සඳහන් ඉඩමේ වෙන්දේසිකරු සම්බන්ධ කර එම ඔප්පුව ලබා ගැනීමටත්, වෙන්දේසි ඉඩම් සඳහා ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් ඒවායේ නිර්වද්‍යතාවය තහවුරුකර ගැනීමටත් ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු. 58,581,138 ක් වූ ජංගම නොවන වත්කම් සභාව සතුව පැවතියද ඊට අදාල වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛන යාවත්කාලීන කල යුතු වේ. | ඉදිරියේදී විස්තරාත්මක උපලේඛන පිළියෙල කර ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

3.5.2 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | එකතු වටිනාකම රු. 5,845,318 ක් වූ ධාවන තත්වයේ පවතින ට්‍රැක්ටර් 02 ක් සහ ගලිබවුසරයක් වර්ෂ 03 කට වැඩි කාලපරිච්ඡේදයක් නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් ප්‍රයෝජනවත් ආකාරයට යෙදවීමට ක්‍රියා කළ යුතු වේ. | ඉදිරියේදී ඉතා ඉක්මනින් කසළ එකතු කිරීම ආරම්භ කරන තෙක් මෙම රථ රඳවා තබාගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2016 වර්ෂයේ සිට භාවිතයට නොගන්නා වටිනාකම රු. 4,380,000 ක් වූ ජේ.සී.බී. යන්ත්‍රය සහ ට්‍රැක්ටරය අලුත්වැඩියා කර සභාවේ කටයුතු සඳහා යොදා ගැනීමට 2019 පෙබරවාරි වනවිටත් කටයුතු කර නොතිබුණි. | සභාවේ වත්කම්වලින් නිසි ප්‍රයෝජන ගැනීමට ක්‍රියා කළ යුතු වේ. | ජේසීබී යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා මේ වනවිට මිල ගණන් කැඳවා අනුමත කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත යවා ඇති අතර ට්‍රැක්ටරයද ඉදිරියේදී අළුත්වැඩියා කිරීමට කටයුතු කරමි. |

3.6 ප්‍රසම්පාදනය

3.6.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අගෝසතු මස රු. 98,625 ක් වැයකර ඉදිකරන ලද වර්ග මීටර් 71 ක් වූ නොදිරන කසළ අංගනයේ කොටසකට සෙවිලි කරන ලද දිග අඩි 15 ක් වූ අමානෝ තහඩු 11 ක් මළකඩ කෑමට ලක් වී තිබුණද එම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දිගුකල් පවතින ආකාරයට ඉදිකිරීම් කරවා ගැනීමට සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. | තහඩු වල ඝණකම සම්මත ප්‍රමිතියෙන් ඇති නමුත් නිසි සින්ක් ආස්තරණයක් නොමැති තහඩු යොදා තිබීම හේතුවෙන් මළ බැඳීමට ලක් වී ඇති බව පෙනේ. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 27.66 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 12.13 ක් වීමෙන් ප්‍රතිපාදන වලින් රු. මිලියන 15.33 ක් හෙවත් සියයට 56 ක් උපයෝජනය කර නොතිබුණි. | අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කර ඇස්තමේන්තු සකස්කළ යුතු අතර එම ඉලක්ක සපුරා ගැනීමට ද ක්‍රියා කළ යුතු වේ. | පෙර වර්ෂ සමඟ සසඳා බලා පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුගත කරන ලදී. නමුත් වෙන්කළ මුළු මුදලටම සරිලන වියදමක් සිදු නොවූ බැවින් ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදුව ඇත. 2020 වර්ෂයේ අයවැය සකස් කිරීමේදී මෙම වැය විෂයයන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කර අයවැය සකස් කිරීමට කටයුතු කරමි. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ මාර්තු මාසයේ සිට මාස 3කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන බව කාරුණිකව සඳහන් කරමි. |